# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2374/17 - 2024 මාර්තු මස 05 වැනි අඟහරුවාදා - 2024.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/2021

**2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත**

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 4(අ) වගන්තිය සහ 16(4) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 48 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2024 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2024 අංක 1 දරන ඛනිජතෙල් සම්පත් (ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) පහත සඳහන් ක්‍රියාපටිපාටියට අනුකූලව ඒකාබද්ධ අධ්‍යයන, ගවේෂණය හෝ සංවර්ධනය සඳහා නම් කිරීමට නියමිත ගවේෂණ බිම් කොටස් සහ සංවර්ධන බිම් කොටස් (මෙහි මින්මතු"සිතියම " යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාංකනය කිරීමට සහ නම් කිරීමට අධිකාරිය විසින් අක්වෙරළෙහි සහ ගොඩබිම් ප්‍රදේශයෙහි පොළවේ මතුපිට ජාලක කොටස්වලට බෙදා සිතියමක් සකස් කළ යුතු ය.

(අ) ඛනිජතෙල් සම්පත් ඇති බවට සැක කරන ප්‍රදේශ හඳුනාගැනීම;

(ආ) හඳුනාගත් ප්‍රදේශ ඇතුළත් කරන ලද සිතියම සකස් කිරීම සඳහා අදාළ රාජ්‍ය නියෝජිත ආයතනවල තහවුරු කිරීම ලබා ගැනීම;

(ඇ) ඉහත (ආ) ඡේදය යටතේ තහවුරු කිරීම ලැබීමෙන් පසු, සිතියම සකස් කිරීම සඳහා මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීම;

(ඈ) අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා සිතියමේ කෙටුම්පත ඉදිරිපත් කිරීම; සහ

(ඉ) රජයේ *ගැසට් පත්‍රයේ* සහ අධිකාරියේ වෙබ් අඩවියෙහි සිතියම පළ කිරීම.

(2) සිතියම පිළියෙල කිරීමේ දී -

(අ) සර්වේයර් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද රටේ පිටත මායිම්, සමුද්‍රීය මායිම් සහ වෙනත් අදාළ සිතියම් යොමු සටහන් අක්වෙරළේ මතුපිට ජාලක කොටස් සීමාංකනය කිරීමේ කාර්ය සඳහා භාවිතා කරනු ලැබිය යුතු ය ;

(ආ) අධිකාරිය විමසා සර්වේයර් ජනරාල්වරයා විසින් ගොඩබිම් ප්‍රදේශවල ජාලක කොටස් සීමාංකනය කළ යුතු ය.

3. සිතියම පහත සඳහන් දෑ වලින් සමන්විත විය යුතු යː-

(අ) බිම් කොටසේ අනන්‍ය යොමු අංකය;

(ආ) ඛණ්ඩාංක පද්ධතිය;

(ඇ) ප්‍රක්ෂේපණය;

(ඈ) පාදම්;

(ඉ) පරිමාණය;

(ඊ) මූලාශ්‍රය;

(උ) ප්‍රකාශක අස්ථිත්ව විස්තර; සහ

(ඌ) වෙනත් යම් අදාළ තොරතුරු.

4. අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසුව අධිකාරිය විසින් සිතියම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

5. (1) ගැසට් පත්‍රයේ පළ කරන ලද සිතියම සඳහා කිසියම් වැඩිදියුණු කිරීමක් අවශ්‍ය බව අධිකාරියේ මතය වන අවස්ථාවක, එම සිතියම වැඩිදියුණු කිරීම සඳහා අධිකාරිය විසින් අමාත්‍යවරයාගෙන් විශේෂ අවසරයක් ලබා ගත යුතු ය.

(2) (1) වන අනු නියෝගය යටතේ ලබාගත් විශේෂ අවසරය මත, අධිකාරිය විසින් 2 වන නියෝගයෙහි දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් සිතියම වැඩිදියුණු කළ යුතු ය.

6. 4 වන නියෝගය යටතේ සිතියම ප්‍රකාශයට පත් කිරීමේ කුමක් සඳහන් වුව ද, එමගින් සිතියමේ සීමාංකනය කරන ලද හා නම්කරන ලද ප්‍රදේශයේ සිදු කරනු ලබන රජයේ වෙනත් සංවර්ධන කටයුතු ආරම්භ කිරීම් හෝ ක්‍රියාකාරකම් වළක්වනු නොලැබිය යුතු ය.

EOG 03 - 0036/1

---

එල්. ඩී. බී. 5/2021

**2021 අංක 21 දරන ඛනිජතෙල් පනත**

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 13(3) වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී පනතේ 48 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2024 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

## නියෝග

1. මෙම නියෝග 2024 අංක 2 දරන ඛනිජතෙල් සම්පත් (දත්ත බලපත්‍රකරණ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඛණිජතෙල් සංවර්ධන අධිකාරිය විසින්, තත්කාර්ය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරය යටතේ හැර, යම් තැනැත්තකු විසින් යම් ඛණිජතෙල් දත්තයක් වෙත ප්‍රවේශ නොවිය යුතු ය.

3. වාණිජ, අධ්‍යාපනික හෝ විද්‍යාත්මක භාවිතය සඳහා ඛණිජතෙල් දත්ත වෙත ප්‍රවේශ වීමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින්, දත්ත බලපත්‍රය ලබා ගැනීමේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිපත්‍රයට සාරානුකූලව අයදුමක් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවල දී, තොරතුරු ඉදිරිපත් කරන ලෙස අයඳුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

4. අයඳුම්පත්‍රය ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අයඳුම්පත්‍රය සහ ලේඛනවල අන්තර්ගත වී ඇති කාරණා සැළකිල්ලට ගෙන, (මෙම නියෝගවල "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. 4 වන නියෝගය යටතේ වාර්තාව ලැබීමෙන් පසු, අධිකාරිය විසින්, අයඳුම්පත්‍රයේ සහ ලේඛනවල කාරණා සහ වාර්තාව සහ යම් නිර්දේශ ඇත්නම් ඒවා ද සැළකිල්ලට ගෙන, දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා අයඳුම්කරු වෙත දත්ත ප්‍රවේශ බලපත්‍රයක් නිකුත් කිරීමට අයඳුම්කරු සුදුසුකම් ලබා තිබේ ද යන්න හෝ දත්ත ප්‍රවේශ බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අයඳුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය. අධිකාරිය විසින් එහි තීරණය පිළිබඳ අයඳුම්කරු වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු අතර, දත්ත ප්‍රවේශ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳ හේතු දන්වනු ලැබිය යුතු ය.

6. 4 වන නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට සුදුසුකම්ලත් සෑම තැනැත්තකු විසින් ම, අයඳුම්පත්‍රයේ සඳහන් කර ඇති අවශ්‍යතාව මත පදනම්ව ඛණිජතෙල් දත්ත වෙත ප්‍රවේශ වීම හා ඒවා භාවිතය සඳහා දත්ත ප්‍රවේශ බලපත්‍රය නිකුත් කිරීමට පෙරාතුව අධිකාරිය සමඟ අනාවරණය නොකිරීමේ ගිවිසුමකට, දත්ත බලපත්‍රකරණ ගිවිසුමකට හෝ දත්ත හුවමාරු ගිවිසුමකට එළඹිය යුතු අතර, අදාළ ගිවිසුමට අත්සන් තැබීමෙන් පසු අධිකාරිය විසින් දත්ත ප්‍රවේශ බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. සලකා බලනු ලබන කරුණු සහ දත්තවල බැරෑරුම් ස්වභාවය මත පදනම්ව මණ්ඩලය විසින් දත්ත ප්‍රවේශ බලපත්‍ර ගාස්තුව නිශ්චය කරනු ලැබිය යුතු අතර, අදාළ ගිවිසුම මගින් ඒ බව දන්වනු ලැබිය යුතු ය.

7. සෑම දත්ත ප්‍රවේශ බලපත්‍රයක් ම, කලින් අවලංගු කරන්නේ නම් මිස, අනාවරණය නොකිරීමේ ගිවිසුම, දත්ත බලපත්‍රකරණ ගිවිසුම හෝ දත්ත හුවමාරු කිරීමේ ගිවිසුම බලපැවැත්වෙනු ලබන කාලසීමාව සඳහා වලංගු විය යුතු අතර, එහි නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

8. අනාවරණය නොකිරීමේ ගිවිසුම හෝ දත්ත ප්‍රවේශ බලපත්‍ර ගිවිසුමේ යම් නියමයක් හෝ කොන්දේසියක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කරනු ලැබ ඇති බවට අධිකාරිය විසින් සෑහීමට පත්වන්නේ නම්, 6 වන නියෝගය යටතේ නිකුත් කරන ලද දත්ත ප්‍රවේශ බලපත්‍රය අධිකාරිය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

9. 6 වන නියෝගය යටතේ නිකුත් කරන ලද දත්ත ප්‍රවේශ බලපත්‍රයක්, අදාළ ගිවිසුම කල් ඉකුත්වීමට දින තිහකට පෙර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ අලුත් කිරීමේ ගාස්තුවක් සමග තත්කාර්ය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අයඳුමක් මත අලුත් කරනු ලබිය යුතු ය.

10. අධිකාරිය විසින්, දත්ත ප්‍රවේශ බලපත්‍රයක් නියම හා කොන්දේසි අනුගමනය කර ඇති බවට සෑහීමට පත්වන්නේ නම්, එම බලපත්‍රය, 6 වන නියෝගයට යටත්ව අධිකාරිය විසින් අලුත් කරනු ලැබිය හැකි ය.

11. සෑම භෞතික හෝ මාර්ගගත දත්ත කාමර ප්‍රවේශයක් ම, අනිවාර්යයෙන් දත්ත කාමර මාර්ගෝපදේශ යටතේ ප්‍රදානය කරනු ලැබිය යුතු ය. එවැනි ප්‍රවේශ වීමක් සඳහා විධිවිධාන සැලසීම මගින්, දුරස්ථ සම්ප්‍රේෂණ අවස්ථාවක මෙන් අධිකාරියට සෘජු පිරිවැයක් දැරීමට සිදු වේ නම්, එම පිරිවැය, මණ්ඩලය විසින් නිශ්චය කරන ලද ගාස්තුවක් ආකාරයෙන් අයඳුම්කරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

12. දත්ත ප්‍රවේශ බලපත්‍රයක්, අනාවරණය නොකිරීමේ ගිවිසුමක්, දත්ත බලපත්‍රකරණ ගිවිසුමක් හෝ දත්ත හුවමාරු කිරීමේ ගිවිසුමක් පවරනු නොලැබිය යුතු අතර, මුල් අයඳුම්කරු හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු බවට පත් වන්නේ නම්, පැවැත්ම භෞතිකව අවසන් වන්නේ නම් හෝ අන්‍යාකාරයෙන් ඔහුගේ නෛතික තත්ත්වය වෙනස් වන්නේ නම්, අධිකාරියේ ලිඛිත අනුමතය ඇත්නම් මිස එම ගිවිසුමේ වලංගුභාවය අවසන් කරනු ලැබිය යුතු ය.

13. මෙම නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස-

"දත්ත ප්‍රවේශ බලපත්‍රය" යන්නෙන්, ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය විසින්, බලපත්‍රලාභියා වශයෙන් යම් ඛනිජතෙල් දත්ත වර්ග වෙත ප්‍රවේශ වීමට සහ ඒවා භාවිත කිරීමට යම් අයදුම්කරුවකු හෝ යම් අස්ථිත්වයක් සඳහා දෙනු ලබන බලපත්‍රයක් අදහස් වේ;

"දත්ත හුවමාරු කර ගැනීමේ ගිවිසුම" යන්නෙන්, අධ්‍යාපනික හෝ වාණිජ නොවන ඛනිජතෙල් දත්ත පැවරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය හා වෙනත් පාර්ශවයක් අතර ඇති කරලනු ලබන ගිවිසුමක් අදහස් වේ;

"අනාවරණය නොකිරීමේ ගිවිසුම" යන්නෙන්, අධිකාරිය විසින් සපයනු ලබන යම් තොරතුරු රහසිගතව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය හා වෙනත් අස්ථිත්වයක් අතර ඇති කරගනු ලබන ගිවිසුමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය" යන්නෙන්, 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය අදහස් වේ;

"ඛනිජතෙල් දත්ත" යන්නට, 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ ඇති අර්ථයම ලබා දිය යුතු ය.

(3 වන නියෝගය)

## I වන උපලේඛනය

| දත්ත ප්‍රවේශ බලපත්‍ර අයදුම්පත්‍ර ආකෘතිය | | | |
|---|---|---|---|
| අයදුම්කරුගේ නම | | | |
| තනතුර | | | |
| සංවිධානය/ආයතනය | | | |
| ලිපිනය | | | |
| සමාගම් සංස්ථාපන අංකය | | | |
| විද්‍යුත් ලිපිනය | | | |
| දුරකථන අංකය | | | |
| අයදුම් කරනු ලබන කාණ්ඩ | | ෆැක්ස් අංකයඃ | |
| | | | කරුණාකර "✓" ලකුණ යොදන්න |
| 1. භෞතික හෝ මාර්ගගත ක්‍රමවේද යටතේ දත්ත කාමරය වෙත ප්‍රවේශ වීම සඳහා | | | |
| 2. අධිකාරියෙන් හෝ බලපත්‍රලාභී කොන්ත්‍රාත්කරුවකුගෙන් මිල දී ගැනීම සඳහා | | | |
| 3. අධ්‍යයන පර්යේෂණ සඳහා | | | |
| ඛනිජතෙල් දත්ත ලැයිස්තුව (කරුණාකර www.pdaslgov.lk හි ඇති පී.ඩී.ඒ.එස්.එල්. (PDASL) දත්ත නාමාවලිය පරිශීලනය කරන්න) | | | |
| බලයලත් අනුයෝජිතවරයාගේ අත්සන සහ විස්තර | | | |
| ඉහත දක්වා ඇති තොරතුරු මාගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය බව මවිසින් ප්‍රකාශ කරනු ලබන අතර, ඛනිජතෙල් දත්ත ලැබීමෙන් පසු, රහස්‍යභාවය ආරක්ෂා කරමින් ඒවා හුවමාරු කර නොගැනීමට මෙයින් එකඟ වෙමි.<br>අත්සන : ............................ දිනය : ..................................<br>නම : ............................<br>තනතුර : ............................ | | | |
| සාමාන්‍ය | | | |

| | |
|---|---|
| | (1) සියලුම ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කරනු ලබිය යුතු ය.<br><br>(2) සියලු බණිජතෙල් දත්ත හි හිමිකාරීත්වය ශ්‍රී ලංකා රජය වෙත පැවරී ඇති අතර, එම බණිජතෙල් දත්ත පාලනය කිරීම අධිකාරිය වෙත පැවරී ඇත.<br><br>(3) අධිකාරිය විසින් මෙම අයදුම්පත්‍රය සමාලෝචනය කර, දත්ත සඳහා බලපත්‍රය ලබා දෙන්නේ ද යන්න තීරණය කරනු ලැබිය යුතු ය. අයදුම්කරු වෙත එම තීරණය පිළිබඳ නිසියාකාරව දැනුම් දෙනු ඇත. අධිකාරියෙහි තීරණය අවසන් තීරණය විය යුතු ය. |

අයදුම්පත්‍ර,

dg@pdasl.gov.lk හරහා හෝ
බණිජතෙල් සංවර්ධන අධිකාරිය,
6 වන මහළ,
සෙලින්කෝ හවුස්,
ජනාධිපති මාවත,
කොළඹ 01,
ශ්‍රී ලංකාව,
යන තැපැල් ලිපිනය ඔස්සේ අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

EOG 03 - 0036/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.